# සාම අධ්‍යාපනය පිළිබඳ හැඳින්වීමක්

## A Study of Peace Education

හබරකඩ සුමේධ හිමි


## Abstract

Peace education as a series of "teaching encounters" that draw from people Their desire for peace, Nonviolent alternative for managing complicit, Skills for critical analysis of structural arrangements that produce and legitimize injustice and inequality. James Page suggests peace education be thought of as "encouraging a commitment to peace as a settled disposition and enhancing the confidence of the individual as an individual agent of peace; as informing the student on the consequence of war and social injustice; as informing the student on the value of peaceful and just social structures and working to uphold or develop such social structures; as encouraging the student to love the world and to imagine a peaceful future; and as caring for the student and encouraging the student to care for others". Often the theory or philosophy of peace education has been assumed, but not articulated. Johan Galtung suggested in 1975 that no theory for peace education existed and there was clearly an urgent need for such theory. More recently there have been attempts to establish such a theory. Joachim James Calleja has suggested that a philosophical basis for peace education might be located in the Kantian notion of duty. James Page has suggested that a rationale for peace education might be found in virtue ethics, consequentialist ethics, conservative political ethics, aesthetic ethics, and care ethics. Robert L. Holmes claims that a moral presumption against violence exists among civilized

nations. On the basis of this presumptive prohibition, he outlines several philosophical values, including pacifism, relevant to the nonviolent resolution of international conflicts. Since the early 20th century, "peace education" programs around the world have represented a spectrum of focal themes, including anti-nuclearism, international understanding, environmental responsibility, communication skills, nonviolence, conflict resolution techniques, democracy, human rights awareness, tolerance of diversity, coexistence, and gender equality.

**Keywords:** Conflict, Education, Encourage, Ethics, Peace

## හැඳින්වීම

"ජීවිතයෙහි සෑම අවස්ථාවක ම, සාමය සාක්ෂාත් කරගත හැකිය. යුද්ධයේ භීෂණයෙන් දුඃඛිත වෙනවා ද නැද්ද යි යනුවෙන් තම දෛවය තෝරා ගැනීම මිනිසාගේ වගකීම යි. අද මනුෂ්‍ය වර්ගයා තීරණාත්මක මංසන්ධියකට පැමිණ සිටියි. ඔහුට සාම මඟ චිත්ත ධෛර්යයෙන්, අධිෂ්ඨානයෙන් හා පරිකල්පනයෙන් යුතුව තෝරා ගැනීමට අවස්ථාව තිබේ" (ෆෙඩරික් මේයර්) පුද්ගලයාට ජීවිතයේ ඕනෑම අවස්ථාවක සාමය සාක්ෂාත් කර ගැනීමට පුළුවන. එනමුත් වර්තමානය වන විට සමස්ථ ලෝකයම සාමයේ සීමා පවුරු බිඳලමින් යුද්ධයේත්, භීෂණයේත් නිම්වළලු පුළුල් කර ගනිමින් මහා විනාශයක් කරා යොමු වෙමින් පවතී. මෙම අභාග්‍ය සම්පන්න තත්වයට පුද්ගලයා පත් වීම වැලැක්විය නොහැකි කාරණාවක් වනුයේ මිනිසා ස්වභාවයෙන්ම කළහකාරී හා වනචාරී ගතිවලින් යුක්ත වන නිසාවෙනි. මෙම තත්වය වෙනස් කරනු වස් පවතින එකම සහ පරමාදර්ශී ක්‍රමවේදය වන්නේ අධ්‍යාපනයයි. එනමුත් වර්තමානයේ දී අධ්‍යාපනයෙන් මෙය සම්පූර්ණ වී ඇත් ද යන්න සැක සංකා හැර ගැනීමට ලෝකය දෙස විවෘත මනසින් යුතුව බලන ඕනෑම සවිඥානිකයෙකුට හැකිය. මෙනයින් බලන කල වෙන කවර දාකටත් වඩා වර්තමාන ලෝකයට මෙය ආදේශ කිරීම වඩාත් කාලෝචිත වූවකි. එම කාර්ය සිදු කළ හැකි ප්‍රබලතම සහ එකම ක්‍රමය වන අධ්‍යාපනයෙන් එය ඉටුකර ගැනීමට ලබා ගත හැකි දායකත්වය පිළිබඳ වඩා බර තැබීමකින් යුක්තව විමසා

බැලිය යුතුය. ඒ අනුව මෙහිදී සාම අධ්‍යාපනය පිළිබඳ වඩා ගැඹුරින් සාකච්ඡා කිරීම සිදු කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

සාමය ස්ථාපිත කිරීමෙහිලා අධ්‍යාපනයේ කාර්යභාර්ය අත්‍යවශ්‍ය වේ, යන උපකල්පනය මත පිහිටා ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ එන ග්‍රන්ථ සන්ධාර ක්‍රමයෙන් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ. මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී පොත්පත්වලට අමතරව විවිධ සඟරා ආශ්‍රයෙන් ද දත්ත සපයා ගන්නා ලදී. එමෙන්ම දත්ත රැස් කිරීම සඳහා මූලාශ්‍රය ලෙස අන්තර්ජාලය ද පාදක කොටගෙන දත්ත රැස් කර ගැනීම සිදු කෙරිණි.

**සාකච්ඡාව**

සාමය යනු පුද්ගලයා තුළ සිදුවන චර්යාවන් නිසි පරිදි හසුරුවා ගැනීම මගින් හටගන්නා වූ ඵලයකි. මිනිසුන් යහපත් වීම මත සාමය ගොඩනැගේ. නමුත් ස්වභාවයෙන්ම ආක්‍රමණශීලි ගති පැවතුම් ඇති මානව වර්ගයා ස්වභාවයෙන්ම සාමකාමී නොවෙති. කලහකාරී වෙති. මත්ස්‍ය න්‍යාය පරිදි හැම විටම ප්‍රබලයා විසින් දුබලයා යටපත් කිරීමට ඔවුන් නිරන්තරව කටයුතු කරනු ලබයි. වර්තමානය වන විට සාමය යන්න නිරන්තර උල්ලංඝනය වීමට භාජනය වන මාතෘකාවකි. තම තමන්ගේ ශක්‍යතාව පරිදි ලෝක බලවතුන්ගේ පටන් දිළින්දා දක්වා සාමය උල්ලංඝනය වෙමින් පවතී. සාමය යන්න ස්වයංජාතව හට ගන්නක් නොවන අතර එය පුද්ගලයා තුළ ඇති කළ යුත්තකි. මේ කාර්ය පැවරෙන්නේ ස්වභාවයෙන්ම වනචාරී ලක්ෂණ පෙන්නුම් කරන මානවයා සැබවින් මිනිසුන් බවට පත් කරලීමේ ප්‍රධාන වගකීම පැවරෙන අධ්‍යාපන ක්‍රියාවලියටයි. නමුත් වර්තමානය වන විට බොහෝ අධ්‍යාපන ක්‍රමවේදයන් මේ සඳහා සුදුසු මැදිහත් වීමක් සිදුකිරීමට අපොහොසත්ව ඇති බව දැකගත හැකිය. පාසල් හි පවත්වනු ලබන ක්‍රිකට් තරඟ ආදියේ දී ඇති වන්නා වූ ප්‍රචණ්ඩ ක්‍රියාවන්, පාසල තුළ සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා, ගුරුවරුනට පහර දීම් ආදී බොහෝ ප්‍රචණ්ඩ ක්‍රියාවන් වත්මන් පාසල තුළ සුලභ වීම මගින් පෙනී යන්නේ සාම අධ්‍යාපනය ගොඩනැගීමේ ප්‍රධාන වගකීම සහිත ආයතනය වන පාසල ඒ සඳහා සුදුසු මැදිහත් වීමක් සිදු කිරීමට අපොහොසත්ව ඇති බවයි.

ඒ අනුව මෙහිදී සාම අධ්‍යාපන යනු කුමක්ද එහි අවශ්‍යතාව කෙබඳු ද යන්න පිළිබඳ සාකච්ඡා කිරීම අපේක්ෂිතය.

ප්‍රථමව සාමය යනු කුමක්ද යන්න හඳුනාගත යුතුය. සාමය යන්න මෙහිලා නිර්වචනය කර ගැනීම වැදගත්ය. ඒ අනුව සාමය යන්න විද්වතුන් විසින් අර්ථ දක්වන ආකාරය පිළිබඳ විමසා බැලිය යුතුය.

''සාම අධ්‍යාපනය සඳහා කිසිඳු න්‍යායක් නොපවතින බවත් එවැනි න්‍යායක් සඳහා හදිසි අවශ්‍යතාවයක් පවතී.'' (ගල්ටුන්, 1975)

''වඩාත් මෑතක දී එවැනි න්‍යායයක් ස්ථාපිත කිරීමට උත්සාහ දරා ඇත. සාම අධ්‍යාපනය සඳහා දාර්ශනික පදනමක් රාජකාරී පිළිබඳ කාන්ටියානු දර්ශනය තුළ තිබිය හැකිය.'' (කලේජා, 1991)

''සාම අධ්‍යාපනය සඳහා තාර්කිකත්වයක්, යහපත් ආචාර ධර්ම, ගතානුගතික දේශපාලන ආචාර ධර්ම, සෞන්දර්යාත්මක ආචාර ධර්ම සහ රැකවරණය පිළිබඳ ආචාර ධර්ම තුළ පිහිටා ඇත.'' (ජේම්ස් පේජ්. එස්, 2008)

''ශිෂ්ඨ සම්පන්න ජාතීන් අතර ප්‍රචණ්ඩත්වයට එරෙහි සදාචාරාත්මක උපකල්පනයක් පවතී. මෙම උපකල්පන තහනම් පදනම මත සාමකාමිත්වය ඇතුළු ජාත්‍යන්තර මට්ටමින් ජාතීන් අතර ගැටුම් අවිහිංසාවාදී ලෙස විසඳීමට අදාළ දාර්ශනික සාරධර්ම කිහිපයකි. න්‍යෂ්ටික විරෝධී වැඩසටහන්, ජාත්‍යන්තර අවබෝධය, පාරිසරික වගකීම, සන්නිවේදන කුසලතා, අවිහිංසාව, ගැටුම් නිරාකරණය, ශිල්පීය ක්‍රම, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් පිළිබඳ දැනුවත්භාවය, විවිධත්වය ඉවසීම, සහජීවනය සහ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය යනු ඒවා වේ.'' (Oppenhciner, 2001)

**සාමය ඇති කිරීම සඳහා වර්ධනය කළ යුතු ගුණාංග**

සාමය පිළිබඳ ඉදිරිපත් වන නිර්වචන අනුව පැහැදිලි වන්නේ එය හදිසි අවශ්‍යතාවයක් වන බවයි. තවද,

- තාර්කිකත්වය

- යහපත් ආචාරධර්ම
- සෞන්දර්යාත්මක ආචාර ධර්ම
- ගතානුගතික දේශපාලන ආචාර ධර්ම
- රැකවරණය පිළිබඳ ආචාර ධර්ම
- ජාතීන් අතර ගැටුම් අවිහිංසාවාදී ලෙස විසඳීම
- න්‍යෂ්ටික විරෝධී වැඩසටහන්
- ජාත්‍යන්තර අවබෝධය
- පාරිසරික වගකීම
- සන්නිවේදන කුසලතා
- අවිහිංසාව
- ගැටුම් නිරාකරණය
- ශිල්පීය ක්‍රම
- ප්‍රජාතන්ත්‍රවාදය
- මානව හිමිකම් පිළිබඳ දැනුවත් භාවය
- විවිධත්වය ඉවසීම
- සහජීවනය
- ස්ත්‍රී - පුරුෂ සමානාත්මතාවය

යන මූලික ගුණාංග පැවතීම සාමය සඳහා අවශ්‍යවන බවය. මේ සියලු ගුණාංග පුද්ගලයා තුළ ඇති කරනු ලැබිය යුත්තේ රටක් තුළ ක්‍රියාත්මක අධ්‍යාපන ක්‍රමය මගිනි.

**සාම අධ්‍යාපනයේ අවශ්‍යතාව**

අධ්‍යාපනයේ ප්‍රතිඵල ලෙස පුද්ගලයා තුළ තේමා කිහිපයක් ඔස්සේ සාමය ගොඩනැගිය යුතුය. එනම්,

01. භෞතික සාමය

02. අධ්‍යාත්මික සාමය

03. පාරිසරික සාමය

භෞතික සාමය යනු පුද්ගලයා සමාජමය වශයෙන් ජීවත් වීමේ දී ඔහු අවට පරිසරය, මිනිසුන් ආදී විචල්‍යයන් සමඟ කලහකාරී නොවූ මිත්‍රශීලීව ජීවත් වීමයි. ආධ්‍යාත්මික සාමය යනු පුද්ගල මනස තළ සිතුවිලිවල ඇති සාමකාමී බවයි. පාරිසරික සාමය යනු ස්වභාව දහම සමඟ මිත්‍රශීලී ලෙස කටයුතු කිරීමයි. වර්තමානය වන විට සාමයේ විචල්‍යයන් සියල්ලම පාහේ උද්ධමනය වෙමින් පවතී. මේ නිසා මානවයා ඇතුළු පෘතුවිය ඉතා සුළු කාලයකින් ජීවය රහිත මළ ග්‍රහයෙකු විය හැකිය. සාම අධ්‍යාපනය යනු මේ අගතිගාමී තත්වයෙන් මිදීම සඳහා අවශ්‍ය වන අධ්‍යාපනයක් ඉගෙනුම් ලාභීන් වෙත ලබා දීමයි.

සාම අධ්‍යාපනයේ කාලීන අවශ්‍යතාව සලකා ඉන්දියාව, පකිස්ථානය, භූතානය, මාලදිවයින, නේපාලය හා ශ්‍රී ලංකාව යන රටවල අධ්‍යාපනඥයින් 2001 ජනවාරි මස 03 වන දින යෝජනාවලියක් සකස් කරන අතර එය සාම අධ්‍යාපනයේ මූලික අඩිතාලම ලෙස හඳුනාගත හැක. එහිදී ඒ.එස් බාලසූරිය ඉදිරිපත් කරන ලද 'Learning the way of peace' නමැති කෘතිය නවදිල්ලියේ පිහිටි යුනෙස්කෝ කලාප කාර්යාලය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ මත පදනම්ව සාමය ගොඩනැගීම පිළිබඳ විවිධ ප්‍රවේශයන් හඳුන්වා දී ඇති බව හඳුනාගත හැක. එහෙත් එම යෝජනා වර්තමාන පාසල තුළ ප්‍රායෝගිකව ක්‍රියාත්මක ද යන්න විවාදාපන්නය.

''යුද්ධය හට ගන්නේ මිනිසුන්ගේ සිත් තුළ බැවින් සාමයේ පවුර ඉදි කළ යුත්තේ මිනිසුන්ගේ සිත් තුළය.'' (යුනෙස්කෝ ව්‍යවස්ථාව, 2001)

යුද්ධය යනු මිනිසුන්ගේ සිත් තුළ ඇති වන්නකි. මිනිසුන් සිතන ආකාරය වෙනස් කිරීම මගින් සාමය උදාකරගත හැකි බව යුනෙස්කෝ සංවිධානය දක්වයි.

''ජීවිතයේ සෑම අවස්ථාවකම සාමය සාක්ෂාත් කරගත හැකිය. යුද්ධයේ භීෂණයෙන් දුක්ඛිත වෙනවා ද නැද්දැයි යනුවෙන් තම දෛවය තෝරා ගැනීම මිනිසාගේ වගකීමයි. අද මනුෂ්‍ය වර්ගයා තීරණාත්මක මංසන්ධියකට පැමිණ සිටියි. ඔහුට සාම මඟ චිත්ත ධෛර්යයෙන්, අධිෂ්ඨානයෙන් හා පරිකල්පනයෙන් යුතුව තෝරා ගැනීමට අවස්ථාව එළඹ තිබේ.'' (මේයර්, 2001)

අනාගතය කෙසේ විය යුතු ද යන්න නුවණින් සිහි කිරීම වර්තමාන මිනිසාගේ වගකීමකි. එම වගකීමෙන් ඉවත්ව යාම මිනිසා විසින් මිනිසාටම සිදු කර ගන්නා වූ අගතියකි. මානවයා මේ තීරණාත්මක අවස්ථාවේ දී නිසි මඟකට යොමු කරමින් සාමයේ බීජ වැපිරිය හැක්කේ අධ්‍යාපනය මගිනි.

සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියම සාමය සඳහාය. එබැවින් සාමය යනුවෙන් අමුතුවෙන් යමක් සිසුන්ට ඉගැන්විය යුතු ද යන්න අයෙකු සිතිය හැකිය. එම ප්‍රකාශය එක්තරා මට්ටමකට සාධාරණ විය හැක. නමුත් ගැටළුව වන්නේ වර්තමාන පාසල් පංතිකාමරය තුළ දී විෂය නිර්දේශ ආවරණය විනා සාම සංකල්ප ඉගැන්වීමට ප්‍රමාණවත් අවධානයක් ලබා දෙන්නේ ද යන්නයි. සැබවින්ම සාමකාමී නව පරපුරක් බිහි කිරීමට විශේෂ උවමනාවකින් ක්‍රියා කරන්නේ ද, සාම සංකල්ප ඇතුළත් වී තිබුණත් ඒවා ප්‍රායෝගික භාවිත වන්නේ ද, එසේ භාවිත වන්නේ නම් මීළඟ පරපුර තවතවත් සාමකාමී නොවන්නේ ද?,

මනුෂ්‍යය සමාජය අද වන විට ප්‍රචණ්ඩත්වයේ සියලු සීමා පවුරු බිඳගෙන සීඝ්‍රයෙන් හිස ඔසවමින් පවතී. මිනිසා තම වර්ගයාට හා ස්වභාව ධර්මයට එරෙහිව සිදු කරනු ලබන ප්‍රචණ්ඩ ක්‍රියාවල තරම දකින ඕනෑම සබුද්ධිකයෙකුට නිතැතින්ම ඇති වන්නේ භීතියකි. අප වාසය කරන්නේ පෙර නොවූ විරූ ලෙස ත්‍රස්තවාදය, යුද්ධ, අපරාධ, අසාධාරණය, පීඩනය, දූෂණය, වංචාව, සූරාකෑම් ආදී වූ විවිධ ස්වරූපයන්ගෙන් ප්‍රචණ්ඩත්වය රජයන යුගයකය. ස්වල්ප පිරිසක් භුක්ති විඳින සංවර්ධනය හා දියුණුවේ යටින් දිවෙන යථාර්ථය වන්නේ

එයයි. දිනෙන් දින මානව ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් ජීවිත රැක ගැනීමට අන්ත දිළිඳුකම අභියස දැඩි ප්‍රයත්නයක යෙදී සිටිති. මිනිසා විසින්ම වික්ෂිප්තව ගිය ගැටුම් පිරි සමාජයක් ගොඩනගා ගෙන තිබේ.

මෙහි දුක්ඛිත තත්වය වන්නේ සමාජ වික්ෂිප්තතාව හා ගැටුම් ළමා පරපුරේ නිර්මල සිත් කෙරෙහි කරන බලපෑමයි. ළමයින් වටා ඇති මේ වික්ෂිප්ත වූ ප්‍රචණ්ඩතාවයේ චෛතසිකයන් ඔවුන් පහසුවෙන්ම ග්‍රහණය කර ගන්නේ අත්දැකීම් පදනම්ව උගනී යන මූලධර්මයට අනුවය. එසේ වීම හරහා මේ වන විටත් සමාජයේ පවත්නා ප්‍රචණ්ඩත්වය තීව්‍ර කරමින් ඉදිරියට ගෙන යන ඊළඟ පරම්පරාව බවට ඔවුන් පත්වීම වළකාලිය නොහැකිය. මේ නිසාම දරුවන්ගේ හදවත් තුළ සාමයේ බිජුවට වැපිරවීම අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යය විය යුතුය.

වර්තමානය වන විට රටවල් කිහිපයක් හැරුණු විට අන් සියලු රටවල් මේ ප්‍රචණ්ඩත්වයේ ආක්‍රමණශීලී රැල්ලට හසු වී තිබේ. යම් රටක් නිරුපද්‍රිතව පවතින්නේ නම් ඒ අධ්‍යාපන ක්‍රමයේ පවතින ඵලදායිතාව මතය. ජීවත් වීමට සුදුසුම රටවල් ලෙස හඳුන්වනු ලබන ස්කැනේඩියානු රටවල් මේ සඳහා උදාහරණ වේ. එහෙත් ලෝකයේ බලපෑමෙන් තව කෙතෙක් කල් එම රටවල් ඒ අයුරින්ම පැවතිය හැකි ද යන්න ගැටළුවකි. සීඝ්‍රයෙන් වැඩෙන ලෝකායතවාදී තෙරපුම හේතු කොට ගෙන අධ්‍යාපන ක්‍රමවේදයන් විභාග කේන්ද්‍රීය වීම හරහා විෂය කරුණු ඉගැන්වීමට සීමා වූ පටු ක්‍රියාවලියක් බවට පත්වීම හරහා තවදුරටත් සිදු වන්නේ ප්‍රචණ්ඩතාවය හා සමාජ විරෝධී ක්‍රියාවන්ගේ ඉහළ යාම විනා අවම වීමක් නොවේ. එබඳු විෂය කේන්ද්‍රීය විභාග ප්‍රමුඛතාව හේතු කොටගෙන සමස්ථ අධ්‍යාපන ක්‍රමයෙහිම නිර්මලතාවය, සුන්දරත්වය දැනටමත් ගිලිහී ගොස් තිබේ. එය ඉගෙනීමෙහි චමත්කාරය හා සතුට ළමයින්ගෙන් පැහැර ගනු ලබමින් පවතී. දූෂිත සමාජයේ එකා පරයා අනෙකා දුවන තරඟයකට ඔවුහු පුහුණු කිරීම වර්තමාන අධ්‍යාපන ක්‍රමය මගින් සිදු කෙරෙමින් පවතී. පාසල යනු තවදුරටත් විවේකී නිදහස් ස්ථානයක් නොව තරඟ දුවන රේස් පිටියක් වී හමාරය.

වත්මනේ දී පාසල් ගුරුවරුන්ට දරුවන් හැසිරවීමේ දී බොහෝ දුෂ්කරතා, අභියෝග ආදියට මුහුණ දීමට සිදුව තිබේ. ඒ

අතර ප්‍රධානතම ගැටළුව වන්නේ විනය පිරිහීමයි. එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතය, සමාජ විරෝධී ක්‍රියා, පාසල්හි හතු පිපෙන්නාක් සේ ඇති වෙමින් පවතී. වසරකට පාසල් වියේ සිසුන් විශාල ප්‍රමාණයක් සියදිවි හානි කර ගන්නේ ද මෙහි අතුරුඵල නිසාය.

''ගැටවර වියේ සිසුන්ගේ අමන හැසිරීම් පුදුම සහගතයි. අපි ඒ කාලේ හිටියට වඩා මොවුන් බොහොම වෙනස්'' (සාමයේ මග ඉගෙනීම,ගුරු මාර්ගෝපදේශය, 2002) වර්තමාන පාසල් යෞවනයන් පිළිබඳව එම විය ඉක්ම වූවන්ගෙන් විමසුවහොත් ඔවුන් පොදුවේ දෙනු ලබන පිළිතුර වන්නේ මෙයයි. වර්තමානයේ අප පාසල්වලින් සමාජගත කරන තාරුණ්‍ය කෙරෙහි සමාජයේ පවතින්නේ අප්‍රසාදයකි. ඔවුන් සමාජයේ ගැටළු ගැන නොසැලකිලිමත් වූත් අසංවේදී වූත් ආත්මාර්ථකාමී වූත් පටු සිත් ඇති, ගැඹුරු බුද්ධියක් නොමැති, දූෂිත සමාජයේ ප්‍රචණ්ඩතාවය වැනි විනාශකාරී බලවේගයනට පහසුවෙන් ගොදුරුවන පිරිසකැයි මහජනයා සිතති. එහෙත් ඔවුන් අතර සිටින විශිෂ්ටතමයන් කිහිප දෙනාට සෙස්සන්ගේ නග්නත්වය වැසීමට නුපුළුවන.

1978 දී සාම අධ්‍යාපනයේ අවශ්‍යතාවය පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ලද ආර්.ඩී. ලෙයින් (Lein, 1978) නමැති අධ්‍යාපනඥයා ද සාම අධ්‍යාපනයේ අවශ්‍යතාවය මැනවින් දක්වා තිබේ. ඒ අනුව ඔහු දක්වන්නේ,

''අද බ්‍රිතාන්‍යයේ උපදින දරුවා විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමේ සම්භාවිතාවට වඩා උම්මත්තකාගාරයකට ඇතුළත් වීමේ සම්භාවිතාව වැඩිය. අප දරුවන්ට සැබෑ ඉගෙනීමක් ලබා දෙනවාට වඩා සිදු කරන්නේ ඔවුන් පිස්සු ගැන්වීමයි.'' (යුනෙස්කෝ ව්‍යවස්ථාව, 2002) යනුවෙනි. මෙයින් විස්තර කෙරෙන්නේ බ්‍රිතාන්‍යයේ පමණක් නොව සමස්ථයක් ලෙස 21 වන සියවසේ අනාගතයයි.

වර්තමාන අර්බුද හමුවේ ළමයින්ට සාමකාමී ලෙස දිවි ගෙවීමේ ක්‍රමවේදය ඉගැන්වීමේ වැදගත්කම පිළිබඳ යම් අවදිවීමක් අධ්‍යාපන ලෝකයෙහි ඇතැම් රටවල දක්නට ලැබේ. එහි ප්‍රතිඵල ලෙස සාධනීය අධ්‍යාපන ක්‍රමවේදයන් සහිත රටවල පාසල් විෂය මාලාවට වැඩි වැඩියෙන් සාම සංකල්ප හා ආකල්ප, සාරධර්ම, ජීවන සාරධර්ම

වැනි අංශයන් ද ඒහා සම්බන්ධ චර්යා නිපුණතා ඇතුළත් කිරීමට නව පෙළඹීමක ප්‍රවණතාවයක් ද පවතී. එසේම සාමකාමී ජීවනය හා සම්බන්ධ සාරධර්ම අධ්‍යාපනය, සංස්කෘතික ඉවසීම ප්‍රගුණ කිරීම ආදී විෂය ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ නව උද්යෝගයක් ද පැන නැගී තිබේ.

අතීත අධ්‍යාපන ක්‍රමවේදයන් තුළ පුද්ගලයෙක් විෂය කරුණු දන්නා ප්‍රමාණය මත යහපත් වෙතැයි සැලකිනි. එහි ප්‍රතිඵලයක් ලෙස අධ්‍යාපන ක්‍රියාවලිය තුළින් දරුවන්ගේ ප්‍රජානන ක්ෂේත්‍රය වර්ධනය කිරීම කෙරෙහි බෙහෙවින් උද්යෝගීමත් වූහ. මෙලෙස ප්‍රජානන ක්ෂේත්‍රයට වැඩි (ඥාන ක්ෂේත්‍රය) අවධානයක් ලබා දීමත් නිසා ළමයින්ගේ චිත්තවේගීය, සදාචාරමය හා මානුෂවාදී ක්ෂේත්‍රයන් වර්ධනය කිරීම නොසලකා හරින ලදී. මේ අසමතුලිත ඉගෙනුමෙහි ප්‍රතිඵලය වූයේ වර්තමාන තාරුණ්‍ය තුළ පවත්නා අසහනකාරී, පරපීඩිත, මත්ලෝලී, සාම විරෝධී ආකල්ප හා චර්යාවන් සඳහා නැඹුරුව තවතවත් තීව්‍ර වීමයි.

**සාම අධ්‍යාපනය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම**

සාම අධ්‍යාපනය පිළිබඳ ප්‍රවේශය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමෙන් පසු ඒ සමගාමී වැඩසටහන් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක විණි. ඒ සඳහා සහභාගී වූ ශිෂ්‍යයෙක් දක්වන ලද අදහස මෙහිලා වැදගත් වේ.

''මේ වැඩසටහන මගේ සිතට තදින් බලපෑවේය. පාසලෙහි ගැටුම් ඇති කර නොගෙන සහනශීලී හා සහයෝගයෙන් යුක්තව ජීවත් වන්නේ කෙසේ දැයි එයින් මා තුළ අවබෝධයක් පහළ විය. එය අනාගතයෙහි සාමකාමී පුරවැසියෙක් ලෙස ප්‍රීතිමත් හා ඵලදායී ජීවිතක් ගත කිරීමට බෙහෙවින් උපකාරී වේ.'' (සහබය සඟරාව,2000)

මෙයින් පැහැදිලි වන්නේ පාසල් වියේ දරුවන් අනාගත සාමකාමී ජීවිතයකට යොමු කළ හැකි බවයි. එහෙත් ඒ සඳහා සුදුසු මැදිහත් වීමක් පාසල සිදු කළ යුතුය යන්න මැනවින් ඉන් ප්‍රදර්ශනය වේ. තාරුණ්‍ය නරක නැත. ඔවුන්ට අත්දකින්නට පෙනෙන්නට තිබෙන ලෝකය ග්‍රහණය කර ගැනීම ඔවුන් විසින් සිදු කරමින් සිටී. ඔවුන් නිවැරදි මාවතකට යොමු කිරීම මගින් සාමකාමී පිරිසක් ලෙස සමාජගත වන්නට ඔවුන් සූදානම් බව ඉන් මනාව ප්‍රදර්ශනය වේ.

''මගේ ගුරු ජීවිතයේ මෙවැනි නව දැනුමක් හා ප්‍රබෝධමත් ඉගෙනුම් අත්දැකීමක් මම අන් කිසිදු සැසියක් මෙතෙක් නොලදිමි. යහපත් ආකල්ප ඇති පුද්ගලයෙකු ලෙස මා වෙනස් වී ඇතැයි හඟිමි. අපේ රටේ නැතිව ගිය සාමය හා සමගිය යළි ගොඩනැංවීමට මේ වැඩසටහන ඵලදායී වනු නිසැකය.'' (සහබය සඟරාව, 2000)

පූර්වෝක්ත වැඩසටහනට සම්බන්ධ වූ ගුරුවරයෙකු විසින් දක්වා ඇති අදහසට අනුව ද සාම අධ්‍යාපනයෙහි වැදගත්කම මනාව පිළිබිඹු වේ.

සාම අධ්‍යාපනය පිළිබඳ කතිකාවත ලොව පුරා ව්‍යාප්ත වීමත් සමඟ ඇමරිකා එක්සත් ජනපදය ද මේ නව සංකල්පය කෙරෙහි අවධානය යොමු කරන්නට විය. මේ නව ප්‍රවේශය අත්හදා බැලූ රොබින් මොන්ටිස් නමැති ගුරුවරයෙක් ද ඊට සමාන අදහසක් ඉදිරිපත් කර තිබේ.

''පාසල ඇරඹුණි. මා පුහුණුවකින් අත්දුටු හා කියවීමෙන් ඉගෙන සිටි ඵලදායී ක්‍රියාකාරකම් කිහිපයක් පාඩම සමඟ ඉදිරිපත් කළෙමි. ඒ හා සමගින් හාස්කම් සිදු වනු මම දුටුවෙමි. සිසුන් පන්ති කාමරයෙහි ඔවුනොවුන් සමඟ අර්ථවත් මිත්‍රශීලී සම්බන්ධතා ගොඩනග නු මම දුටුවෙමි. ඉගෙනීම නීරස වී සිටි සහ වෙනත් ගැටලුවලින් වෙලී සිටි සිසුන් ඉගෙනීම ආරම්භ කරනු මම දුටුවෙමි. මා සහ සිසුන් අතර වඩා නිර්ව්‍යාජ සම්බන්ධතා ගොඩනැගෙනු මම දුටුවෙමි. එය හුදෙක් ගුරු-ශිෂ්‍ය සාම්ප්‍රදායික ආකෘතියට වඩා එකිනෙකාගෙන් ඉගෙන ගන්නා සුලු මානුෂික සම්බන්ධතාවයකි''(brown ,1972)

සාම අධ්‍යාපනය පාසලින් මිස අන් කිසිදු විචල්‍යයක් මගින් ස්ථාපිත කළ නොහැකිය. සාම අධ්‍යාපනය පාසලට අදාළ වන ආකාරය පිළිබඳ අදහස් දක්වන ෆ්‍රැන් ස්ච්මිට් සහ ඇලින් ෆ්‍රීඩ්මන් (1998) පවසන්නේ,

''සුලු අධ්‍යාපනය කුසලතා ගොඩනගයි. එය ළමයින්ට තමන් සමගත් අන්‍යයන් සමගත් සුසංයෝගීව ජීවත් වීමට හා ඇතිවන ගැටුම් නිර්මාණාත්මකව හා අවිහිංසාවාදීව විසදා ගැනීමට අවශ්‍ය ශක්තිය ලබා දෙයි. සාමය ගොඩනැංවීම සෑම මනුෂ්‍යයෙකුගේම මෙන්ම

සමස්ථ මානව වර්ගයාගේම අභියෝගයයි. එම අභියෝගයට සාර්ථක ලෙස කළමනාකරණය කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කරන බලවත්ම ආයතනය වන්නේ පාසලයි.'' (ස්විමිට් ෆ්‍රැන්, 1988)

මේ අනුව පැහැදිලි වන්නේ සාම අධ්‍යාපනය යනු සමාජ ප්‍රචණ්ඩත්වයෙන් ළමයින්ගේ සිත් කෙලසීම වළක්වාලමින් ඔවුන්ගේ සිත් තුළ අවිහිංසකත්වය ආරක්ෂා කරන හුදු ප්‍රතිකාරක ක්‍රියාවලිය පාසල තුළින් රෝපණය කළ යුතු බවයි. එය ළමුන්ගේ සිත්වල පූර්ණ වර්ධනය එල්ල කරගත් ප්‍රයත්නයක් වේ. එය ළමා සිත තුළ උසස් මට්ටමේ මානුෂීය ගුණ හා සාරධර්ම වගා කිරීම මගින් ස්ව අරමුණ මෙන්ම සමාජ ප්‍රගමණය ද සිදු වේ. එනම්, සමස්ථ මානව වර්ගයාගේ ම හිතසුව පිණිස සාමකාමීව ජීවත් වීමට හා සාමය ගොඩනැංවීමට අවශ්‍ය වන චර්යා කුසලතා සමූහයක් එමගින් වර්ධනය වනු ලබන බවයි.

පාසලට පැවරෙන මේ භාරධූර වගකීම ඉටුකර ගැනීමට සාමකාමී ආකල්ප, සාරධර්ම හා කුසලතා පාසලේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සෘජුවම එක් කළ යුතුය. එය තවත් එක් අන්තයක පවතින ඉගෙනුම් ඵලයක් පමණක් නොවිය යුතුය. පාසලේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට සමෝධානය කර එය සමස්ථ විෂයමාලාවේ අංගයක් බවට පත් කළ යුතුය.  වර්තමානය වන විටත් ඇතැම් රටවල් හා ඇතැම් ආයතනවල මේ ප්‍රයත්නය, සාරධර්ම අධ්‍යාපනය (මැලේසියාව හා පිලිපීනය), පුරවැසි අධ්‍යාපනය (ඇමෙරිකා එක්සත් ජනපදය), අන්‍යෝන්‍ය අවබෝධය සඳහා අධ්‍යාපනය (අයර්ලන්තය), සංවර්ධනාත්මක අධ්‍යාපනය (යුනිසෙෆ් ආයතනය) ආදී විවිධ ස්වරූපගත විෂය සන්ධාර ඉදිරිපත් කර තිබේ. එමෙන්ම විෂයක් වශයෙන් ඉදිරිපත් කිරීමට අමතරව සාම අධ්‍යාපනය විධිමත් හා විෂය සමගාමී විෂය මාලාව හා සමෝධානිතව ඉදිරිපත් කළ හැකිය.

**සාම අධ්‍යාපනය පාසලට යොදා ගැනීම**

සාම අධ්‍යාපනය පාසලට යොදා ගැනීමෙන් හා සාම සංස්කෘතියක් ගොඩනගා ගැනීමෙන් පාසල්වලට පහත දැක්වෙන ප්‍රයෝජන ලබා ගැනීමට හැකි බව ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ආයතනයේ ගැටුම් නිරාකරණය සඳහා අධ්‍යාපන ව්‍යාපෘතියෙහි දක්වා තිබේ.

- වඩා මානුෂික කළමනාකරණ ප්‍රවේශයක් වර්ධනය කර ගත හැකි වෙයි.

- ගුරු-සිසු, ගුරු-ගුරු, ශිෂ්‍ය-ශිෂ්‍ය ආදී පාසල් ප්‍රජා කාණ්ඩ අතර මානුෂික සම්බන්ධතා වැඩි දියුණු කර ගත හැකි වෙයි.

- සිසුන් තුළ මෙන් ම ගුරුවරුන් තුළ ද යහපත් ආකල්ප වර්ධනය කර ගත හැකි වෙයි. උදාහරණ : සහයෝගය, අන්‍යෝන්‍ය ගෞරවය.

- සිසුන් තුළ නිරෝගී චිත්තවේගී සංවර්ධනයක් සිදු වෙයි.

- සහයෝගී හා අන්තර් ක්‍රියා ඉගෙනුම් ක්‍රියාකාරකම්වල යෙදීම හේතුවෙන් සිසුන්ගේ සමාජානුයෝගීතාව වැඩේ.

- සිසුන්ගේ විනය හා සදාචාරය වැඩි දියුණු වේ.

- ගුරු-සිසු දෙපාර්ශවයේ ම නිර්මාණශීලීත්වය ඉහළ නගියි.

- ඉගැන්වීමේ මෙන් ම ඉගෙනීමේ දී ගුණාත්මක භාවය සංවර්ධනය වෙයි. (සාමයේ මග ඉගෙනීම, 2003)

තවද, වර්තමාන පාසල් පරිසරය තුළ සාමය ස්ථාපිත කිරීම යොදාගත හැකි චිත්තවේගීය ඉගෙනුම් ක්‍රම පිළිබඳව රොබින් මොට්ස් (2001) සිදු කරනු ලබන ඇගයුම් උපුටා දැක්වීම අතිශය වැදගත්ය. ඒ අනුව,

- ප්‍රජානන ඉගෙනුම (දැනුම හා සම්බන්ධ කරුණු ඉගෙනුම) වැඩි දියුණු වීම.

- ඉගෙනුම් අවස්ථාවන්හී සිසුන් වැඩි පෙළඹීමකින් ප්‍රතිචාර දැක්වීම.

- තමා,අන්‍යයන්, ස්වභාව ධර්මය, හැඟීම් ආදිය පිළිබඳ ධනාත්මක ආකල්ප වැඩීම.

- සිසුන්ගේ වගකීම පිළිබඳ හැඟුම වැඩීම.

- ඇතැම් සිසුන් තුළ පුබුදුවා ගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතයට තිබූ ආශාව බෙහෙවින් අඩු වීම හා නැති වී යෑම. (ඔහුගේ ම වචනයෙන් දැක්වුවහොත් තම ගැටළුවලින් පළා යෑමේ අභිලාශයෙන් යම් යම් මත්ද්‍රව්‍ය භාවිත කරන හෝ වෙනත් ක්‍රම භාවිත කරන සිසු පිරිසක් පන්තියෙහි වූහ. ඔවුන්ගෙන් බොහෝ දෙනා මත්ද්‍රව්‍ය භාවිත කළේ තමන්ට වඩා අර්ථවත් මනෝභාවයක් සොයා ගැනීම පිණිසය. සාම්ප්‍රදායික විෂයමාලාව හා සම්බන්ධ කරගත් චිත්තවේගීය ඉගෙනුම් ක්‍රම භාවිතයෙන් ඔවුහු තමන් සෙවූ ඒ මනෝභාවය වඩාත් පහසුවෙන්, ඉගෙනීම තුළින් අත්දුටුවෝය. එහි ප්‍රතිඵලය වශයෙන් බොහෝ දෙනා මත්ද්‍රව්‍ය අත්හළහ. සමාජයෙන් ගිලිහී යාමට ආසන්නව සිටි අනෙක් සිසුහු තමන්ට අදාළ හා අර්ථවත්වන ඥානය හා අනුභූතිය මේ ඉගෙනුම් ක්‍රියාකාරකම් මගින් සොයා ගත්තෝය. චිත්තවේගීය ඉගෙනුම් ක්‍රම භාවිතයෙන්, සිසුහු වඩා හොඳ සිසුන් බවට චර්යාත්මකව වෙනස් වූ බව දකින්නට ලැබිණ. ඔවුහු වඩාත් ඵලදායී ව අන්‍යයන්ට සම්බන්ධ වීමේ හැකියාව ද ලැබුවෝය. එසේම ඔවුන්ගේ ඉගෙනීමේ අභිප්‍රේරණය ද ලැදියාව ද සතිමත් බව ද හැඩ ගැසීමේ හැකියාව ද වර්ධනය වන ආකාරය සෙසු ගුරුවරු ද දුටුවෝය.) ( සාමයේ මග ඉගෙනීම,(2003)

මේ සෑම අදහසකින්ම සාම අධ්‍යාපනයේ ඵලදායීතාව හා අවශ්‍යතාව මැනවින් ප්‍රදර්ශනය වේ. නමුත් ශ්‍රී ලංකාව තුළ මේ සාම අධ්‍යාපනය සම්බන්ධ අවධානය ඉතා පහළ මට්ටමක පවතින බව හඳුනාගත හැක. ශ්‍රී ලාංකිකයන් තුළ සාමය උල්ලංඝනය වීමේ පළමු බීජය වැපිරෙන්නේ පාසල තුළය. එනම් සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආදී ලෙස පාසල් බෙදා වෙන්කර අනාගත පරපුර ඒ ඒ කුඩුවලට දමා සිරකර ගොඩනංවනු ලබයි. අති බහුතරයක් වූ ශ්‍රී ලාංකිකයන් සංස්කෘතික ඉවසීමෙන් තොරය. සංස්කෘතික ගරුත්වයෙන් තොරය. මේ ප්‍රධාන ගැටළුවේ පටන් විෂය නිර්දේශ ආවරණ ක්‍රමවේදය යම් වෙනසකට බඳුන් කර අධ්‍යාපනයේ ප්‍රධාන කුලුණු හතරවන Learning to know (oek.ekSu msKsi), Learning to do (යමක් කිරීම සඳහා ඉගෙනීම), Learning to be (පෞරුෂ සංවර්ධනයට අදාළ ඉගෙනුම), Learning to live together (එකට

ජීවත්වීම සඳහා ඉගෙනීම) ආදී නිපුණතා ලබා දිය යුතුය. පවතින ප්‍රමාණයට වඩා සාම සංකල්ප විෂය නිර්දේශ සඳහා අන්තර්ගත කළ යුතුය. එසේ සිදු කිරීමෙන් සාමකාමී අනාගත පරපුරක් නිර්මාණය කරගත හැකි අතර එය අධ්‍යාපන ක්‍රියාවලියට පැවරෙන භාරධූර ක්‍රියාවලියකි. කාලීන අවශ්‍යතාවයකි.

**සමාලෝචනය**

සාමය යන වදනින් කියවෙන අර්ථය ඉතාමත් පුළුල් වූවකි. එය විවිධ අර්ථ පරිමාණයක් ආවරණය කරන ඡත්‍ර පදයකි. එය ඉගෙනීමෙන් වඩාත් යහපත් අනාගතයක් උදෙසා තමාගේ චර්යාව, ආත්මීය වශයෙන් මෙන්ම සාමූහික වශයෙන් ද වෙනස් කර ගත හැකි දෙයක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම එය ඉගෙනීමෙන් ලබන ඵලය නිරීක්ෂණය කොට මැනිය හැකි දෙයක් වීම අත්‍යවශ්‍ය ය. සාම අධ්‍යාපනය වර්තමාන සමාජයට ඉතා අවශ්‍ය කාරණාවකි. සාම අධ්‍යාපනයට සමාන යම් පැතිකඩකින් තොර අධ්‍යාපනය අසම්පූර්ණ වේ. එය සදාචාර, සාරධර්ම, පුරවැසි, ප්‍රජාතාන්ත්‍රීය හා ගෝලීය අධ්‍යාපනයේ මූලික පරමාර්ථයක් බවට පත් වීම කාලීන අවශ්‍යතාවයකි. සාම අධ්‍යාපනය වෙනත් අධ්‍යාපනවලින් සුවිශේෂ වන්නේ මනුෂ්‍ය ප්‍රචන්ඩත්වය නමැති ගැටලුවට එය දක්වන ඍජු දායකත්වය නිසාවෙනි. සැකෙවින් දක්වතොත් සාම අධ්‍යාපනය වනාහි මනුෂ්‍ය ප්‍රචණ්ඩත්වය කෙරෙහි අධ්‍යාපනික වශයෙන් දක්වනු ලබන ප්‍රතිචාරය වේ. සමාජයේ පවතින ප්‍රචණ්ඩ ආකල්පවලට ළමා සිත ගොදුරු වීමෙන් ආරක්ෂා කිරීම සඳහා අධ්‍යාපනයට සුවිශාල කාර්යභාර්යයක් පැවරේ. අනාගත ලෝකය සාමකාමී, විවිධත්වය ඉවසන, අනෙකාගේ අයිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කරන ලෝකයක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා එයින් ප්‍රවර්ධනය කළ යුතුය. එමගින් ළමයා ද ඉගැන්වීම ද ඉගෙනුම ද පාසල ද මුළු මහත් ලෝකයම මානුෂීය කරනු ලබයි. එහිලා සමාජයේ සියලු දෙනා තුළ සාමයේ ආකල්ප වර්ධනය කිරීම අතිශයින්ම ප්‍රායෝගික වූත් ප්‍රයෝජනවත් වූවක් ලෙස ද හඳුනාගත හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


කේ, ජේ. ජේම්ස් (1991). *අධ්‍යාපනය හා සාමය පිළිබඳ කාන්ටියානු ඥාන විභාගය, සංකල්ප හා සාරධර්ම පර්යේෂණය.* බ්‍රැන්ඩඩ් විශ්වවිද්‍යාලය.

ගල්ටූන්, ජොහාන් (1975). *සාම පරීක්ෂණය*, පළමු වෙළුම, කෝපන්හේගන්, එල්ජර්ස්

ජාතික අධ්‍යාපන ආයතනය (2000). ගැටුම් නිරාකරණ වැඩසටහන, *සහබය සඟරාව,*

පී. ජේම්ස්, (2008) *සාම අධ්‍යාපනයඃ සදාචාරාත්මක හා දාර්ශනික පදනම් පිළිබඳ ගවේෂණය,* චාලට් තොරතුරු යුග ප්‍රකාශනය.

*සාමයේ මග ඉගෙනීම, 2003, සාම අධ්‍යාපනය පිළිබඳ ගුරු මාර්ගෝපදේශය,* කොළඹඃ ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව (2003). *සාමයේ මග ඉගෙනීම.* කොළඹඃ ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව.

C., Virginia et al (1985). *Resource manual for living revolution. Philadelphia* P.A: New society publishers.

B., George Isaac brown (1972). *Human teaching and human learning, the gestalt journal.* New York: highland.

R., L,oppenhciner and D, bar- Tal ^Eds&, *How children understand war and peace,*